**වර්ගය:** අනිවාර්ය
**පාඨමාලා සංකේතය:** CHCUE2015
**මාතෘකාව:** ක්‍රිස්තියානි ශාසනයේ ඉතිහාසය
**පූර්ව අවශ්‍යතාථ** ක්‍රිස්තියානි සංස්කෘතිය පළමු ස්තරයේ පරීක්ෂණ සම්පූර්ණ කිරීම.
**අරමුණු සහ අභිප්‍රේතාර්ථ:** මෙම පාඨමාලාව මගින් කිතුනු ලෝක සහා ඉතිහාසය සහ ලාංකේය කිතුනු සභා ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධයක් විද්‍යාර්ථීන්ට ලබා දීමට බලාපොරොත්තු වේ.
**ඉගෙනුම් ඵලඃ** මෙම ඒකකය හැදෑරීමෙන් කිතුනු සභා ඉතිහාසයේ විවිධ ප්‍රවණතා හඳුනාගනු ලැබීමටවිද්‍යාර්ථීන්ට හැකිවේ. එමෙන් ම ක්‍රිස්තියානි ශාසනයේ ආරම්භය, මධ්‍යකාලීන යුගයේ මුල් අවධිය, මධ්‍යම හා පසුකාලීන යුග, ක්‍රිස්තියානියේ මුල් නූතන යුගය, 19 වන සහ 20 වන සියවස්වල ක්‍රිස්තියානි ශාසනයේ ඉතිහාසය පිළිබඳ ඓතිහාසික සාධක මනාව දැන ගැනීමට හැකිය. තවද දකුණු ආසියාව තුළ ක්‍රිස්තියානියේ වර්ධනය සහ විශේෂයෙන් ම ලාංකේය ක්‍රිස්තියානි ඉතිහාසයේ පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි සහ පශ්චාත් නිදහස් යුග පිළිබඳ හැදෑරීමට ද හැකියාව ලැබේ.

**පාඨමාලා අන්තර්ගතයඃ**

**පළමු කොටසඃ ලෝක කිතුනු සභා ඉතිහාසය**

1. මුල් සියවස්වල ජෙරුසලමෙන් පිටත විසූ කිතුනු අනුගාමික ප්‍රජාව පිළිබඳව පශ්චාත් අපෝස්තලික යුගයේ සිට කොන්ස්තන්තීනු අධිරාජයා දක්වාඃරෝම අධිරාජ්‍යය තුළ ක්‍රිස්තියානිය හා පීඩන සමය.

2. මිලාන් ආඥාවේ (313)සිට ජෙරුසලමේ වැටීම දක්වා ඉතිහාසයඃ ක්‍රිස්තියානිය, පිළිගත් ආගමක් වීමේ ප්‍රති විපාක, ඒරියානු වාදය සහ එහි ප්‍රතිඵල, තාපස ප්‍රගමනය සහ තාපස විද්වතුන්, මිෂනාරිවරුන් සහ රදගුරුවරුන්ගේ දායකත්වය, මොනොෆිසිස්තවාදය සහ කැල්සිදෝනියානු මන්ත්‍රණ සභාව, බටහිර යුරෝපීය ගෝත්‍රිකයන්ගේ ආක්‍රමණය සහ නැගෙනහිර සභාවට බලපෑ මුස්ලිම් පීඩනය.

3. යුරෝපීය ගෝත්‍ර ක්‍රිස්තියානිය වැළඳගැනීමේ සිට මහ චාලිමේන්ගේ මරණයත් සමඟ රෝම අධිරාජ්‍යය බිඳ වැටීම දක්වා ඉතිහාසයඃ ප්‍රතිමාභංගන මතභේදය, රජය සහ ශාසනය අතර සම්බන්ධතා.

4. තාපස ප්‍රගමනයට ක්ලූනිහි තාපස ජීවිත ක්‍රමයෙන් නව ජීවයක්ලබා දීමේ සිට 15 වන සියවසෙහි ශාසනය පරිහානියට පත්වීම දක්වා ඉතිහාසයඃ සභා නවෝදයක් ඇති කළ ක්ලූනිතාපස ප්‍රතිසංස්කරණයේ වැදගත්කම, ගිහි නිල පැවරුම් මත භේදයල බටහිර රෝම ශාසනයෙන්නැගෙනහිරකොන්ස්තන්තිනෝපල් ශාසනය වෙන් වීම, කුරුස යුද්ධ, ධර්මාධිකරණය, අවිඤ්ඤොන් පාප්වරු සහ බටහිර සභා භේදය.

5. දහසය වන සියවස සිට ප්‍රංශ විප්ලවය දක්වා ඉතිහාසයඃ ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට පෙර යුගය, මාටින් ලූතර්ගේ ප්‍රතිසංස්කරණය, (ප්‍රතිසංස්කරණ ප්‍රගමනයට හේතු හා එහි සාර්ථකත්වයට මුල් වූ සාධක), කතෝලික සභාවේ ප්‍රතිචාරය, (ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාව, ජේසු නිකායිකයින්ගේ භූමිකාව සහ ප්‍රති රෙපරමාදු ප්‍රතිසංස්කරණ ප්‍රගමනයට මුල් වූ ඇතැම් නායකයන්); නව දේශයන් සොයා ගැනීම සහ ඒවා යටත් විජිතකරණයට ලක්වීම මෙන්ම එම බලවේග ක්‍රියා කළ ආකාරය.

6. ප්‍රංශ විප්ලවයේ සිට නූතන යුගය දක්වා ඉතිහාසයඃ ප්‍රංශ විප්ලවය මගින් ක්‍රිස්තියානි ශාසනයට ඇති වූ බලපෑම්, නවවැනි පියුස් පාප්තුමා, පළමු වතිකානු මන්ත්‍රණ සභාව, පාප්තුමාගේ නොවරදින සුලු බව පිළිබඳ ඉගැන්වීම, දෙවන වතිකානු මන්ත්‍රණ සභා සහ ශාසනය ලෝකයට විවෘත වීම.

දෙවන කොටසඃ ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ශාසන ඉතිහාසය

1. පූර්ව පෘතුගීසි යුගයඃ ක්‍රිස්තියානිය ඉන්දියාවේ, චීනයේ හා ශ්‍රී ලංකාවේ ව්‍යාප්තවීම පිළිබඳ මුල් සාක්ෂ්‍යසහ ඒවා ඇගයීම මෙන්ම ඓතිහාසික සාක්ෂ්‍ය පිළිබඳ දැනුම.

2. පෘතුගීසි යුගයඃ පෘතුගීසීන්ගේ පැමිණීම සහ 15, 16 සියවස්හිලංකාවේ දේශපාලන, සමාජීය, ආර්ථික හා ආගමික තත්ත්වය සහ ශ්‍රී ලංකාවට ක්‍රිස්තියානිය හඳුන්වා දීම සඳහා යොදා ගත් ධර්මදූත ක්‍රමවේද.

3. ලන්දේසි යුගයඃ ලන්දේසීන්ගේ පැමිණීම සහ රෝමානු කතෝලික ජනතාව පිළිබඳ ඔවුන්ගේ ප්‍රතිපත්තිය; ඔරතෝරියානු දූත කාර්යය, ජුසේවාස් පියතුමන්ගේ ධර්මදූත මෙහෙවර සහ ජාකෝමේ ගොන්සල්වෙස් පියතුමන්ගේ සාහිත්‍යමය දායකත්වය.

4. බ්‍රිතාන්‍ය යුගයඃ බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමිණීම සහ ඔවුන්ගේ ආගමික ප්‍රතිපත්තිය, බ්‍රිතාන්‍ය සමයේ ලංකාවේ පිහිටුවනු ලැබූ ක්‍රිස්තියානි සභා, බ්‍රිතාන්‍යයන්ගේ ප්‍රතිපත්ති මගින් ඇති වූ දීර්ඝ කාලීන බලපෑම පිළිබඳ සාමාන්‍ය දැනුමක්.

5. පශ්චාත් නිදහස් යුගයඃ නිදහස ලැබීමෙන් අනතුරුව ක්‍රිස්තියානියේ වර්ධනය, ක්‍රිස්තියානි සභා සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් ආගම් අතර සංවාදය.

6. ලාංකේය පාස්කුඃ දුඃඛප්‍රාප්ති නාට්‍ය සම්ප්‍රදායයේ විකාශනය සහ ලෝක පාස්කු දුඃඛප්‍රාප්ති නාට්‍යය අතර ඇති සම්බන්ධය

**ක්‍රමවේදය:** දේශන, සාකච්ඡා, දෘශ්‍ය මාධ්‍ය භාවිතය සහ ප්‍රස්තුතීකරණ මගින්
**ඇගයීමේ ක්‍රමය:** වර්ෂාවසාන විභාගය

**නිර්දේශිත කියවීම්:**

**පළමු කොටස**

Abeyasingha, N. (2011). *History of Christianity: An Undergraduate Study Guide*. Colombo: Godage,.

Don Peter, W. L. A. (1974). *Studies in Christian Education*. Colombo: WesleyPress.

Edwards, D. L. (1997). *Christianity : The First Two Thousand Years*. Maryknoll, Orbris, NY.

Laux, J. (1930). (1989). *Church History*. Tan Books, NY.

Schreck, A. (1995). *The Compact History of the Catholic Church*. Bombay.

Tanner, N. (2011). *New Short History of the Catholic Church*. London: Burns & Oates.

Tanner, N. (2011). *The Councils of the Church : A Short History*.Herder & Herder, NY.

සෝමරත්න, ජී. පී. වී. (2012). *ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය; ක්‍රි. ව. 1500 දක්වා* (පළමු කාණ්ඩය). කොළඹ: දේවධර්ම ශාස්ත්‍රාලය.

සෝමරත්න, ජී. පී. වී. (2012). *ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය; ක්‍රි. ව. 1600 සිට 1900 දක්වා* (දෙවන කාණ්ඩය). කොළඹ: දේවධර්ම ශාස්ත්‍රාලය.

**දෙවන කොටස:**

Don Peter, W. L. A. (1983). *Franciscans and Sri Lanka*. Colombo: Evangel Press.

Don Peter, W. L. A. (1978). *Education in Sri Lanka under the Portuguese*. Colombo: Catholic Press.

Hettiarachchi S. (2012). *Faithing the Native Soil*: D*ilemmas and Aspirations of Post-colonial Buddhists and Christians in Sri Lanka*. Colombo.

Perera S. G. (2005). *Life of Blessed Joseph Vaz*: *Apostle of Sri Lanka*. Ottawa: Humanics Universal INC.

Perera S. G. (2006). *Life of Fr. Jacome Goncalvez*. Ottawa: Humanics Universal INC.

Perera S. G. (2006). *The Jesuits of Ceylon*. Ottawa: Humanics Universal INC.

Perera S. G. (2013). *Historical Sketches*. Colombo: Godage.

Pieris, A. (ed.) Vols. XXV-XXVI 1998- 1999, *Dialogue*, The Ecumenical Institute for Study & Dialogue, Colombo.

Peiris, E. (1978). *Studies Historical Cultural*. Colombo: Catholic Press,

Perniola, V. (1989-1991) *The Catholic Church in Sri Lanka*: *The Portuguese Period* (Vols. I-III). Dehiwala:Tisara.

Perniola, V. (1983-1985). *The Catholic Church in Sri Lanka* : *The Dutch Period* (Vols. I-III). Dehiwala:Tisara.

Perniola, V. (1992- 2001). *The Catholic Church in Sri Lanka* : *The British Period* (Vols. I-VI). Dehiwala:Tisara.

අබේසිංහ, ටී. බී. එච්. (1966). *පරංගි කෝට්ටේ*. කොළඹ: ලේක්හවුස්.

දොන් පීටර්, ඩබ්. එල්. ඒ. (1995). *ලක්දිව කතෝලික උදාව*. දේවධර්ම නිකේතන ප්‍රකාශන 10, කොළඹ.

දොන් පීටර්, ඩබ්. එල්. ඒ. (1996). *කතෝලික පීඩන සමය*. දේවධර්ම නිකේතන ප්‍රකාශන 11, කොළඹ.

දොන් පීටර්, ඩබ්. එල්. ඒ. (1997). *ලක්දිව කතෝලික ව්‍යාප්ති සමය*. දේවධර්ම නිකේතන ප්‍රකාශන 12, කොළඹ.

දොන් පීටර්, ඩබ්. එල්. ඒ. (2001), *ගොන්සාල්වෙස් පාඨාවලී*. කොඹ: ගොඩගේ.

සෝමරත්න, ජී. පී. වී. (2007). *ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය,ක්‍රි. ව. 1800 දක්වා.* කොළඹ: දේවධර්ම ශාස්ත්‍රාලය.

පීරිස්. ඒ. (2008). *ඕලන්ද සමයේ ලංකාවේ ශුද්ධවූ සභා ඉතිහාසය.* කොළඹ: ගොඩගේ.

රොහාන්, ඩබ්ලිව්. (2009). *ලාංකේය පාස්කු-දුඃඛප්‍රාප්ති නාට්‍යයේ ඉතිහාසය. ආකෘති, හා භාවිතය*, කොළඹ: ගොඩගේ.

වෙල්ගම්පල ආර්. (2003). *ලක්දිව කිතුනු පුරාණය.* කොළඹ: කතෝලික ප්‍රකාශන කේන්ද්‍රය.

රුබේරු. කේ. ඊ. ඩබ්ලිව්. (2011). *පෘතුගීසින්ට පෙර ශ්‍රී ලංකාවේ කිතුණුවෝ.* කොළඹ: ගොඩගේ.

වැලිකඩ ආරච්චි, ද. (සංස්) (2006). *හෙළ කලාවේ කිතුනු සලකුණ.* ගොන්සාල්වෙස් සිංහල ආයතනය, අම්පිටිය.